ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## ශ්‍රී ලංකා - ඉන්දියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ දූත පිරිසක් ඉන්දීය සංචාරයක නිරත වේ

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා ප්‍රමුඛ ශ්‍රී ලංකා - ඉන්දියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ 23 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් අගෝස්තු 26 සිට 30 වන දින දක්වා ඉන්දීය සංචාරයක නිරත වූහ. පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ විවිධ පක්ෂ නියෝජනය කරන සංගමයේ නිලධාරී මණ්ඩලයේ සහ විධායක කමිටුවේ සාමාජිකයන් මෙම දූත පිරිසට අයත් විය. මෙම සංචාරයේදී ප්‍රධාන අංශ රැසක ඉන්දියාවේ ආයතනික සහ සංවර්ධන පරිවර්තනය දැක බලා ගැනීමේ අවස්ථාව දූත පිරිසට හිමි විය.

2. දූත පිරිස ලෝක් සභා කතානායක ශ්‍රී ඕම් බිර්ලා මහතා හමු වූ අතර පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය පිහිටුවීම අගය කළ කතානායකතුමා ආයතනික ධාරිතාවයන් ගොඩනැගීමේ සහ සහයෝගීතාවය සඳහා නව ක්ෂේත්‍ර ගවේෂණය කිරීමේ වැදගත්කම අවධාරණය කළේය. ඉන්දියාව විසින් ශ්‍රී ලංකාව වෙත ලබා දෙන අඛණ්ඩ සහ කොන්දේසි විරහිත සහයෝගය සම්බන්ධයෙන් ප්‍රශංසාව පළ කළ දූත පිරිස දෙරට අතර ද්විපාර්ශ්වීය සබඳතා ඉහළ නැංවීමට සිය කැපවීම යළි අවධාරණය කළහ.

3. වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා ඉන්දියාවේ සෞඛ්‍ය සහ පවුල් සුබසාධන අමාත්‍ය ශ්‍රී ජගත් ප්‍රකාශ් නද්දා මහතා සමඟ ද්විපාර්ශ්වික හමුවක් ද පැවැත්වූ අතර එහිදී සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දැනට ක්‍රියාත්මක සහයෝගීතාවය සහ වැඩිදුර සහයෝගීතාවය සඳහා හඳුනාගෙන ඇති අවස්ථාවන් පිළිබඳව සාකච්ඡා කරන ලදී.

4. සංචාරය අතරතුරදී දූත පිරිස පොදු සෞඛ්‍ය සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍රයන්හි ඉන්දියාව ලබා ඇති දියුණුව ද ගවේෂණය කළහ. මේ අනුව All India Institute of Medical Sciences (AIIMS), සහ අත්‍යාවශ්‍ය ඖෂධ සපයන පුරෝගාමී මුලපිරීමක් වන ජන් ඖෂධී කේන්ද්‍ර සහ අධ්‍යාපන තාක්ෂණ ක්ෂේත්‍රයේ startup සමාගමක් වන Physics Wallah යන ආයතනයන්හි සංචාරය කළහ. මෙම සංචාරයන්හිදී සෞඛ්‍ය සේවාව සහ අධ්‍යාපනය තුළ ඉන්දියාවේ නව්‍යකරණය මූලික කරගත් ප්‍රවේශය මෙන්ම අන්තර්ග්‍රහණීය සංවර්ධනය සඳහා එහි ආකෘතීන් පිළිබඳව ද වටිනා දැනුම් සම්භාරයක් රැස් කර ගැනීමේ අවස්ථාව දූත පිරිසට හිමි විය.

5. ආර්ථික සහ වාණිජ සබඳතා ඉහළ නංවමින් දූත පිරිස ඉන්දීය වාණිජ සහ කර්මාන්ත මණ්ඩල සම්මේලනය (FICCI) විසින් සංවිධානය කරන ලද ව්‍යාපාරික වටමේස සාකච්ඡාවකට ද සහභාගී වූහ. මෙහිදී ඖෂධ, සෞඛ්‍ය සේවා යටිතල පහසුකම් සහ තාක්ෂණය යන ක්ෂේත්‍රයන්හි සහයෝගීතාවයට අවධානය යොමු කරමින් වෙළෙඳ සහ ආයෝජන සබඳතා වඩා ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදි.

6. දූත පිරිස ප්‍රජාතාන්ත්‍රිය රාජ්‍යයන් සඳහා පාර්ලිමේන්තු පර්යේෂණ සහ පුහුණු ආයතනය (PRIDE) විසින් ව්‍යවස්ථාමය ක්‍රියාවලීන්, කමිටු ක්‍රියාකාරීත්වයන්, පාලන රාමු සහ මාධ්‍ය නියැලීම් සම්බන්ධයෙන් සංවිධානය කරන ලද සැසි සඳහා ද සහභාගී වූහ.

7. මෙම සංචාරය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පාර්ලිමේන්තු හවුල්කාරිත්වයේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. 2025 මැයි මාසයේ ශ්‍රී ලංකා - ඉන්දියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය පිහිටුවීමෙන් මාස තුනක් ඇතුළත සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු සාමාජිකයන් 20 දෙනෙකුගේ ඉන්දීය සංචාරයෙන් අනතුරුව සිදු වූ මෙම සංචාරය දෙරට අතර ශක්තිමත් ප්‍රජාතාන්ත්‍රිය වටිනාකම් සහ අචල මිත්‍රත්වය වඩාත් තහවුරු කරයි.

****

**කොළඹ**
***2025 අගෝස්තු 31***